# COVID-19 ප්‍රථමාධාර කට්ටලයක් සකස් කරගන්නා ආකාරය

ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රජා පණිවිඩයකි:

fairfirst INSURANCE
A FAIRFAX Company



කැපීම්, සිරීම් හා පිලිස්සීම් වැනි හදිසි අනතුරු ඕනෑම කෙනෙකුට, ඕනෑම මොහොතක ඇතිවිය හැක. එම නිසා මූලික ප්‍රතිකාර සඳහා අවශ්‍ය දේවල් සහිත ප්‍රථමාධාර කට්ටලයක් සෑම නිවසකම හා කාර්යාලයකම තිබිය යුතුය.

මේ වනවිට COVID-19 වෛරස ව්‍යාප්තිය සැලකිය යුතු ලෙස වැඩිවී ඇති නිසා, හදිසි අවස්ථාවකදී අවශ්‍ය විය හැකි අතිරේක ඖෂධ ආදිය ඔබගේ ප්‍රථමාධාර කට්ටලයට එක්කර ගැනීම වැදගත් වේ.

## සාමාන්‍ය ප්‍රථමාධාර කට්ටලයකට සාපේක්ෂව, COVID-19 ප්‍රථමාධාර කට්ටලයක අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු දේවල් පහත දක්වා ඇත.

- විටමින් C - ප්‍රතිශක්තිය වැඩිකිරීමට උපකාරී වේ
- විටමින් E - ප්‍රතිශක්තිය වැඩිකිරීමට උපකාරී වේ
- අධෝරක්ත කිරණ උෂ්ණත්වමානයක්/රසදිය උෂ්ණත්වමානයක්
- ස්පන්දන ඔක්සිමීටරයක්/ඔක්සිජන් මොනිටරයක්
- සීනි/ග්ලූකෝස් නිෂ්පාදනයක්
- භාවිතා කර ඉවත දැමිය හැකි මුහුණු ආවරණ
- දෑත් පවිත්‍රකාරක
- භාවිතා කර ඉවත දැමිය හැකි අත්වැසුම්
- දෑස් ආරක්ෂක වෛද්‍ය කන්නාඩි
- හදිසි අවස්ථාවකදී භාවිතා කිරීමට ජංගම ඔක්සිජන් ටැංකියක් (හැකිනම්)



## සාමාන්‍ය ප්‍රථමාධාර කට්ටලයක අඩංගු වන දේවල්:

- එකිනෙකට වෙනස් ප්‍රමාණයන් හා හැඩයන්ගෙන් යුත් ප්ලාස්ටර්
- කුඩා, මධ්‍යම හා විශාල ප්‍රමාණයේ ගෝස්
- ඇස් වෙළුම් පටි 2 ක්
- ත්‍රිකෝණාකාර බැන්ඩේජ්
- ක්‍රේප් බැන්ඩේජ්
- ආරක්ෂිත කටු
- කතුරු
- ඇල්කොහොල් රහිත ක්ලේන්සින් වයිප්
- සමේ ආසාත්මිකතා සඳහා ක්‍රීම් (hydrocortisone වැනි)
- ඖෂධීය ටේප් වර්ගයක්
- කෘමි සතුන්ගේ සපාකෑම් සහ විදීම් සඳහා ක්‍රීම් හෝ ස්ප්‍රේ
- විෂබීජ නාශක ක්‍රීම්
- පැරසිටමෝල් (දරුවන් සඳහා ළමා පැරසිටමෝල්), ඇස්ප්‍රින් (අවුරුදු 16 ට අඩු දරුවන්ට සුදුසු නොවේ) සහ ibuprofen වැනි වේදනා නාශක
- පිරිටන් හෝ සෙට්‍රිසීන් වැනි ප්‍රතිහිස්ටමටින් ඖෂධ
- තුවාල පිරිසිදු කිරීම සඳහා ආසුත ජලය
- පාචනය සඳහා ඖෂධ
- සුළු පරිමාණ පිලිස්සුම් සඳහා සිල්වර් සල්ෆර්ඩයසීන් ක්‍රීම්

**සැලකිය යුතුයි: නිතිපතා ඔබේ ප්‍රථමාධාර කට්ටලය පරීක්ෂා කර, කල් ඉකුත් වූ දේවල් ඉවත් කර ඒ වෙනුවට අලුත් දේවල් එක්කරන්න.**

---

වගකීම් අත්හැරීමේ ප්‍රකාශය: මෙම ලේඛනයේ දක්වා ඇති උපදෙස් වල අරමුණ වන්නේ ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට COVID-19 වෛරසයෙන් ආරක්ෂා වීමට මගපෙන්වීමය. මෙහි සඳහන් කිසියම් කරුණක්/කරුණු සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් හෝ මෙම කරුණු මත පදනම් වී කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා විශේෂඥ උපදෙස් ලබාගන්න.

**ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්**

ක්ෂණික ඇමතුම්: 0112 428 428 | වෙබ් අඩවිය: www.fairfirst.lk